දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය
Distance and Continuing Education Unit – University of Ruhuna

ශාස්ත්‍රවේදී සාමාන්‍ය (බාහිර) උපාධි ප්‍රථම භාග - 2015 හා 2019 (පුනර් 2015) පරීක්ෂණය - 2020 පෙබරවාරි/මාර්තු
Bachelor of Arts General (External) Degree Part I – 2015 & 2019 (2015 Repeat) Examination–February/March 2020

# සවිසා 2.2 - සමාජ විද්‍යාත්මක ක්‍රම
# SGYG 2.2 - Sociological Methods

කාලය පැය තුන යි

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න
නො පැහැදිලි අත්අකුරුවලට ලකුණු අඩු කෙරේ

---

01. i. විද්‍යාත්මක ක්‍රමයේ මූලික පියවර මොනවා ද?
(ලකුණු 04)

ii. වෝල්ටර් වොලස් විසින් දක්වන ලද 'නිගාමී' හා 'උද්ගාමී' තර්කණ ක්‍රම කෙටියෙන් පැහැදිලි කරන්න.
(ලකුණු 06)

iii. සමාජ විද්‍යාවේදී විද්‍යාත්මක ක්‍රමය අනුගමනය කළ හැකි ද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.
(ලකුණු 10)

02. i. 'දත්ත' හා 'තොරතුරු' අතර පවත්නා වෙනස්කම් මොනවා ද?
(ලකුණු 04)

ii. සමාජ විද්‍යාත්මක අධ්‍යයනවලදී දත්ත විශ්ලේෂණය වැදගත් වන්නේ මන්දැයි පැහැදිලි කරන්න.
(ලකුණු 06)

iii. සමාජ විද්‍යාත්මක අධ්‍යයනවලදී භාවිතා වන ප්‍රධාන දත්ත වර්ගීකරණයන් පැහැදිලි කර, ඒවා දත්ත විශ්ලේෂණයේ දී යොදාගත හැකි ආකාරය පැහැදිලි කරන්න.
(ලකුණු 10)

03. i. 'සාහිත්‍ය විමර්ශනය' යනු කුමක් ද?
(ලකුණු 04)

ii. සමාජ විද්‍යාත්මක අධ්‍යයනවලදී සහිත්‍ය විමර්ශනය මගින් කවර සේවයක් ඉටු වන්නේ ද?
(ලකුණු 06)

iii. ඔබ විසින් තෝරාගත් පර්යේෂණ ගැටළුවක් ඇසුරින්, සාහිත්‍ය විමර්ශනය සිදුකරන ආකාරය පැහැදිලි කරන්න.
(ලකුණු 10)

04. i. සමාජ විද්‍යාත්මක අධ්‍යයනවලදී, පර්යේෂණ යෝජනාවලියක් සකස් කිරීමෙන් ලබාගත හැකි වාසි 04 ක් සඳහන් කරන්න.

(ලකුණු 04)

ii. පර්යේෂණ යෝජනාවලියක අන්තර්ගත කළ යුතු "පර්යේෂණ ක්‍රමවේදය" යටතේ සඳහන් කළ යුතු කරුණු සැකෙවින් දක්වන්න.

(ලකුණු 06)

iii. ඔබ කැමති පර්යේෂණ ගැටළුවක් තෝරාගෙන, එය අධ්‍යයනය කිරීම සඳහා සුදුසු පර්යේෂණ යෝජනාවලියක් සකස් කරන්න.

(ලකුණු 10)

05. i. 'ප්‍රශ්නාවලි ක්‍රමය' යනු කුමක් ද?

(ලකුණු 04)

ii. ප්‍රශ්නාවලියක් සැකසීමේ පියවර මොනවා ද?

(ලකුණු 06)

iii. ඔබ කැමති පර්යේෂණ ගැටළුවක් තෝරාගෙන, එය අධ්‍යයනය කිරීම සඳහා ප්‍රශ්න මාලාවක් සකස් කරන්න.

(ලකුණු 10)

06. i. ක්ෂේත්‍ර අධ්‍යයන සැලැස්මක් යනු කුමක් ද?

(ලකුණු 04)

ii. ක්ෂේත්‍ර අධ්‍යයනයක ප්‍රධාන පියවර මොනවා ද?

(ලකුණු 06)

iii. ක්ෂේත්‍ර අධ්‍යයනයක වාසි, අවාසි විවේචනාත්මකව සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

07. i. 'සිද්ධි අධ්‍යයන ක්‍රමය' යනු කුමක් ද?

(ලකුණු 04)

ii. සිද්ධි අධ්‍යයන ක්‍රමයේ ප්‍රයෝජන මොනවා ද?

(ලකුණු 06)

iii. ඔබ තෝරාගත් පර්යේෂණ ගැටළුවක් අධ්‍යයනය කිරීම සඳහා සිද්ධි අධ්‍යයන ක්‍රමය යොදාගත හැකි ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 10)

08. පහත මාතෘකාවලින් දෙකක් (02) සඳහා සටහන් ලියන්න.

i. සමීක්ෂණ ක්‍රමය
ii. නියැදීම
iii. සම්මුඛ සාකච්ඡා ක්‍රමය
iv. පර්යේෂණ වාර්තාව

(එක් පිළිතුරකට ලකුණු 10 බැගිනි)

********************************